# එච් ඒ පී එන් ජයතිලක එ. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

RTIC Appeal (පෞද්ගලික විභාග කිරීම)/138/2018 - 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන් හි (ගාස්තු සහ අභියාචනා කාර්යයපටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යයපටිපාටිය -

මෙම අභියාචනා විභාගය 20.04.2018 දින පැවති කොමිෂන් සභා රැස්වීමේ කොටසක් ලෙස පවත්වන ලදී.

**සභාපති -** මහින්ද ගම්මන්පිල

**කොමිෂන් සභා සාමාජික -** ජොෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන

**කොමිෂන් සභා සාමාජික -** ජොෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා

**කොමිෂන් සභා සාමාජික -** ආචාර්ය සෙලවී තිරුචන්ද්‍රන්

**කොමිෂන් සභා සාමාජික -** විනිසුරු රෝහිනී වල්ගම

**අධ්‍යක්ෂ ජනරාල් -** පියතිස්තස රණසිංහ

**අභියාචක -** එච් ඒ පී එන් ජයතිලක

**නොතීසි ලත් පාර්ශව -** කොමසාරිස් ජෙනරාල්/ නම්කළ නිලධාරී, ගොවිජන සංවර්ධන දෙපාර්තමන්තුව

**පෙනීසිටීම**

**අභියාචක -** සී ජයවීර

ඒ එච් ඕ ඩී ජයවීර

**පොදු අධිකාරිය -** එල් පී ආර් සී ජයසිංහ, නීති නිලධාරී, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය: | 27.09.2017 - ඉල්ලීම් 3ක් ඉදිරිපත් කරන ලදී |
| තොරතුරු නිලධාරියා තීරණය ලබා දුන් දිනය: | 28.09.2017 (ඉල්ලීම ලැබුණු බව දැන්වීම) |
| නම්කළ නිලධාරියා වෙත අභියාචනය යොමු කළ දිනය: | 20.10.2017 |
| නම්කළ නිලධාරියා තීරණය ලබා දුන් දිනය: | පිළිතුරක් ලබා දී නොමැත |
| RTIC කොමිෂන් සභාව වෙත අභියාචනය යොමු කළ දිනය: | 18.12.2017 |

**අභියාචනයට පසුබිම් වූ කරුණු:**

අභියාචක, 27.09.2017 දින තොරතුරු ඉල්ලීම් තුනක් මගින් පහත සඳහන් තොරතුරු ඉල්ලා සිටින ලදී.

1. ගෝ.සං.කො. (සේවා) ගේ අංක 7/7/75/හම්/11/ වෙ VI හා 2011.10.12 දිනැති ස. කො. (හම්) වෙත යොමු කර ඇති ලිපියේ අංක 3හි සඳහන් කර ඇති පරිදි "ප්‍රවේණිය තැන්පත් කිරීම සම්බන්දයෙන් අද ගොවීන් වෙත ලි.ප.තැ. මගින් දැන්වූ ලිපිවල" ඔබ වෙත ලැබී ඇති පිටපත් සහතික කරන ලද පිටපත් වශයෙන්
2. ගෝ.සං.කො. (සේවා) ගේ අංක 7/7/6/HM/2-2 හා 2012.12.17 දිනැති ස. කො. (හම්බන්තොට) වෙත යොමු කර ඇති ලිපියේ අවසාන පරිච්චේදයෙහි ගො.සං. කොමසාරිස් (සේවා) විසින් විමසා ඇති කරුණු සඳහා හම්බන්තොට සහකාර කොමසාරිස් විසි න් ලබා දී ඇති පිළිතුරු ලිපියේ සහතික කරන ලද පිටපතක්

(අමුණා ඇති 17.12.2012 දිනැති ලිපියේ 1,2,3 වශයෙන් මෙසේ සඳහන් කර ඇත.

I. විකුනුම්කර දෙකක් ඉදිරිපත්වීම සිදුවුයේද නැද්ද යන වගත්
II. එලෙස ඉදිරිපත් කර ඇත්නම් එකී විකුනුම්කර (අනෙක් පාර්ශවයන්) සහභාගිවූ කුඹුරු හිමියන් පිළිගත්තාද නැද්ද යන වගත්
III. එකී විකුනුම්කර දෙක සම්බන්ධයෙන් ලුණම ගොවිජන සංවර්ධන නිලධාරියගේ නිරීක්ෂණය කුමක්ද)

3. කුරුලුමුල්ල කුඹුරේ ප්‍රවේණි මුදල් තැන්පත් පිළිබඳව ස කො.(ගො.සේවා හම්බන්තොටගේ 2010.06.08 දිනැති ඔහුගේ අංක 42/ප්‍ර/විවිධ/ලුණම ලිපය මගින් අද ගොවීන් තුන්දෙනාම ප්‍රවේණි මුදල්, කම්ටුවේ තැන්පත් කරන ලෙසට නියෝගයක් ලබා දී ඇත.

   ඒ අනුව 2007 යල කන්නයේ සිට මේ දක්වා අදාළ අද ගොවීන් තුන් දෙන විසින් කම්ටුවේ තැන්පත් කරන ලද ප්‍රවේනි මුදල් ප්‍රමාණයපහත සඳහන් පරිදි විස්තර සහිතව

   I. අද ගොවියාගේ නම
   II. වගා කරන ලද අක්කර ප්‍රමාණය
   III. හිඟ ප්‍රවේණිය මුදලින් කොපමණ ප්‍රමාණයක් තැන්පත් කර ඇත්ද යනවග

   අදාළ තැන්පත් ප්‍රවේනි මුදල් ප්‍රමාණය එක්එක් මාසයක් සඳහා සලකා මහා කන්න ලෙසට වෙන් වෙන් වශයෙන් දක්වන්න

අභියාචක හට තොරතුරු නිලධාරීගෙන් තොරතුරු ඉල්ලීම ලැබුණු බව හැර අන් කිසිදු ප්‍රතිචාරයක් නොලද හෙයින්, නම්කළ නිලධාරී හට 20.10.2017 දින අභියාචනයක් යොමු කරන ලදී. නම්කළ නිලධාරීද පිළිතුරු සැපයීමට අපොහසත් වූ හෙයින්, අභියාචක 18.12.2017 දින කොමිෂන් සභාව වෙත අභියාචනයක් යොමු කරන ලදී.

**අභියාචනා අවස්ථාවේ උද්ගත වූ කාරණා:**

පොදු අධිකාරිය අභියාචක හට 18.04.2018 දින පිළිතුරු ලබාදෙමින් ලිපියක් යවන ලදී. ( කොමිෂන් සභා වාරයට දෙදිනකට පෙර). මෙම තොරතුරු නිරීක්ෂණය කර එයින් සෑහීමකට පත් වන්නේ දැයි කොමිෂන් සභාවට දැනුම් දෙන බවට අභියාචකගේ පාර්ශවය ප්‍රකාශ කළේය.

**නියෝගය:**

පොදු අධිකාරිය ලබාදුන් තොරාතුරු නිරීක්ෂණය කොට එයින් සෑහීමකට පත් වන්නේ දැයි කොමිෂන් සභාවට දැනුම් දෙන ලෙසට අභියාචක හට මෙයින් නියෝග කර සිටිමු. ලබා දුන් ප්‍රතිචාරය පිළිබඳව අභියාචක සෑහීමකට පත් වන්නේ නම් මීළඟ දිනට අභියාචනය කැඳවනු නොලැබ අභියාචනය මෙසේ අවසන් කරනු ලැබේ.

අභියාචනය කල් තබන ලදී.

මීළඟ කැඳවීම් දිනය: 05.06.2018

---

RTIC Appeal (පෞද්ගලික විභාග කිරීම)/138/2018 - 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන් හි (ගාස්තු සහ අභියාචනා කාර්යයපටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යයපටිපාටිය -

මෙම අභියාචනා විභාගය 05.06.2018 දින පැවති කොමිෂන් සභා රැස්වීමේ කොටසක් ලෙස පවත්වන ලදී.

**සභාපති -** මහින්ද ගම්මන්පිල මහතා

**කොමිෂන් සභා සාමාජික -** ජ්‍යෝෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන මෙනෙවිය

**කොමිෂන් සභා සාමාජික -** ජ්‍යෝෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා මහතා

**කොමිෂන් සභා සාමාජික -** ආචාර්ය සෙලවී තිරුචන්ද්‍රන් මහත්මිය

**කොමිෂන් සභා සාමාජික -** විනිසුරු රෝහිනී වල්ගම මහත්මිය

**අධ්‍යක්ෂ ජනරාල් -** පියතිස්සස රණසිංහ මහතා

**පෙනීසිටීම**

**අභියාචක** (වෙනුවෙන්) - සී ජයවීර

ඒ එච් ඕ ඩී ජයවීර

**පොදු අධිකාරිය -** එරංග අතපත්තු, සහකාර කොමසාරිස් - නෛතික, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

**අභියාචනා අවස්ථාවේ උද්ගත වූ කාරණා:**

පොදු අධිකාරිය ලබා දුන් තොරතුරු පිළිබඳව සෑහීමකට පත් වන්නේ දැයි කොමිෂන් සභාව අභියාචක පාර්ශවයෙන් විමසා සිටින ලදී. එය්අට පිළිතුරු ලබා දුන් අභියාචා පාර්ශවය පවසා සිටියේ පොදු අධිකාරිය තොරතුරු ඉල්ලීමේ අයිතම 1 ට අදාලව පිළිතුරු ලබා දී තිබුනද, අයිතම 2 සහ 3 ට අදාලව පිළිතුරු ලබා දී නොතිබූ බවයි.

මේ පිළිබඳව කොමිෂන් සභාව පොදු අධිකාරියෙන් විමසා සිටි අවස්ථාවේදී පොදු අධිකාරිය පවසා සිටියේ මෙම තොරතුරු හම්බන්තොට කලාප කාර්යාලයට සම්බන්ධ තොරතුරු වන බවත් එම කාර්යාලයේ සහකාර කොමසාරිස්වරයා හට තමා මෙම තොරතුරු ලබා දීමට දන්වා ඇති බවත් ය. කෙසේ වෙතත් මෙම දින වන තෙක් ඉල්ලා සිටින ලද තොරතුරු ලබා දීමට සහාකාර කොමසාරිස්වරයා අපොහොසත් වී ඇත. මෙයට පිළිතුරු සපයමින් කොමිෂන් සභාව පවසා සිටියේ පොදු අධිකාරියේ අන්තර් පරිපාලන ක්‍රියාපටිපාටිය පිළිබඳව මෙම අභියාචනයට සම්බන්ධතාවක් නොමැති බවයි. පොදු අධිකාරිය තව දුරටත්

පවසා සිටියේ ඉල්ලා සිටින ලද තොරතුරු අධිකාරිය භාරයේ, පාලනයේ හෝ සතුව තිබේ නම් එම තොරතුරු ලබා දීමට කටයුතු කරන බවත්, එසේ නොමැති වුවහොත් ඒ පිළිබඳව කොමිෂන් සභාවට ලිඛිතව දැනුම් දීමට කටයුතු කරන බවයි.

**නියෝගය:**

පොදු අධිකාරියේ අභ්‍යන්තර පරිපාලන පටිපාටියේ සිදුවන ප්‍රමාදවීම් අභියාචනයකට අදාළ තොරතුරු ලබා දීමෙන් වැලකී සිටීමට ප්‍රමාණවත් හේතු සාධකයක් නොවන අතර මෙය පනත ප්‍රකාරව සාධාරණීකරණය කළ නොහැක. ඉල්ලා සිටින ලද තොරතුරු අධිකාරිය භාරයේ, පාලනයේ හෝ සතුව තිබේ නම් එම තොරතුරු 28.06.2018 දින හෝ ඊට ප්‍රථම අභියාචක වෙත ලබා දීමට කටයුතු කරන ලෙස පොදු අධිකාරියට මෙයින් නියෝග කර සිටිමු. එසේ නොමැති වුවහොත් ඒ පිළිබඳව කොමිෂන් සභාවට ලිඛිතව දැනුම් දීමට කටයුතු කරන ලෙස පොදු අධිකාරියට නියෝග කර සිටිමු.

තවද, මීළඟ කැඳවීම් දිනයේදී පොදු අධිකාරියේ තොරතුරු නිලධාරී සහ හම්බන්තොට කලාප කාර්යාලයේ සහකාර කොමසාරිස්වරයාගේ පැමිණීම අත්‍යවශ්‍ය බවට නියෝග කර සිටිමු.

අභියාචනය කල් තබන ලදී.

මීළඟ කැඳවීම් දිනය: 28.06.2018